# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2001 අංක 7 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කලේ 2001 අප්‍රේල් මස 11 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2001 අප්‍රේල් මස 12 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 4.50 යි. තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

## 2001 අංක 7 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2001 අප්‍රේල් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 21/2001.

**1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම සහ ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2001 අංක 7 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන, 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "මේ පනතේ උපලේඛනයෙහි පිළිවෙළින් දක්වා ඇති අනුප්‍රමාණ අනුව" යන වචන වෙනුවට "මේ පනතේ උපලේඛනයේ පිළිවෙළින් දක්වා ඇති මුදල් ප්‍රමාණවලට සමාන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. *1988 අංක 40 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එහි (3) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :– *ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(3) බද්දේ යම් වාරිකයක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක–

(අ) ඒ පැහැර හැරීම 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඒ දිනයෙන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් වර්ෂයක දී ගෙවිය යුතු වාරිකයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, පැහැර හැරි තැනැත්තා විසින්, එසේ පැහැර හැර ඇති වාරිකයට අමතරව දණ්ඩනයක් වශයෙන් –

(i) පැහැර හැර ඇති වාරිකයෙන් සියයට දහයකට සමාන මුදලක් ; සහ

(ii) යම් වාරිකයක් පැහැර හැර ඇති වාරිකයක් බවට පත්වීම ආරම්භ වූයේ යම් මාසයක දී ද ඒ මාසයට පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනට පෙර ඒ පැහැර හැර ඇති

2—H 011622—4,400 (2001/04)

වාරිකය ගෙවනු නොලැබුවහොත්, ඒ පැහැර හැරීම සිදුකරගෙන යන එක් එක් අනුගාමී මාසයේ පහළොස්වන දින දක්වා කාල පරිච්ඡේදය සඳහා හෝ ඉන් කොටසක් සඳහා එකී වාරිකයෙන් සියයට දෙකකට සමාන වැඩිදුරට වූ මුදලක්,

ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මේ ඡේදය යටතේ දණ්ඩනය වශයෙන් ගෙවිය යුතු මුදල, කිසිම අවස්ථාවක, ගෙවීම පැහැර හැර තිබෙන වාරිකයෙන් සියයට පණහක් නොඉක්මවිය යුතු ය.

(ආ) පැහැර හැරීම, 2001 අප්‍රේල් මස 1 වන දිනයේ දී හෝ ඉන් පසුව ආරම්භ වන යම් වර්ෂයක දී ගෙවිය යුතු වාරිකයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, පැහැර හැරි තැනැත්තා විසින් එසේ පැහැර හැර ඇති වාරිකයට අමතරව, ඒ වාරිකය පැහැර හැර ඇති වාරිකයක් වීම ආරම්භ වනුයේ යම් මාසයක දී ද ඒ මාසයට පසුව එළඹෙන එක් එක් මාසයේ පහළොස්වන දිනයෙන් අවසන් වන එක් එක් කාල පරිච්ඡේදය සඳහා හෝ ඒ වාරිකය පැහැර හැර ඇති වාරිකයක්ව පවතින ඒ කාල පරිච්ඡේදයෙන් කොටසක් සඳහා, පැහැර හැර ඇති වාරිකයෙන් සියයට තිස්තුනයි තුනෙන් එකකට සමාන මුදලක්, දණ්ඩනයක් වශයෙන් ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ ඡේදය යටතේ දණ්ඩනය වශයෙන් ගෙවිය යුතු මුළු මුදල, කිසිම අවස්ථාවක, ගෙවීම පැහැර හැර තිබෙන වාරිකය මෙන් සියයට සියයක් නොඉක්මවිය යුතු ය.

(3අ) පැහැර හැරීම සිදු වීමට හේතු වී ඇති යම් විශේෂ අවස්ථාගත කරුණු නිසා ඒ දණ්ඩනය අඩුකිරීම හෝ අත්හැර දැමීම සාධාරණ හා යුක්තිසහගත බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, (3) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩන මුදලක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩු කිරීම හෝ අත්හැර දැමීම හෝ කරනු ලැබිය හැකි ය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය මගින් හෝ ඒ යටතේ" යන වචන වෙනුවට " 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය මගින් හෝ ඒ යටතේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

උපලේඛනය (2 වන වගන්තිය)

I වන කොටස

බුකිකරුවකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යන්නා වූ තැනැත්තකු විසින්, මෙහි I වන තීරුවේ නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහා ම ගෙවනු ලැබිය යුතු බද්ද මෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතු ය.

| *I වන තීරුව* වර්ෂය | *II වන තීරුව* බදු මුදල |
|---|---|
| 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා | රුපියල් එක් ලක්ෂයයි |
| 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා | රුපියල් මිලියන එකයි |

II වන කොටස

සුදු ව්‍යාපාරය කරගෙන යන්නා වූ තැනැත්තකු විසින්, මෙහි I වන තීරුවේ නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහා ම ගෙවනු ලැබිය යුතු බද්ද, මෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතු ය.

| *I වන තීරුව* වර්ෂය | *II වන තීරුව* බදු මුදල |
|---|---|
| 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා | රුපියල් මිලියන එකයි |
| 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා | රුපියල් මිලියන විසිපහයි |

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.